රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2017

මගේ අංක EST-6/OFTIM/07/4021
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.04.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2009.04.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 සහ 2009.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009(I) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් රාජ්‍ය නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු බවට එම චක්‍රලේඛ මඟින් උපදෙස් හා විධිවිධාන නිකුත් කර ඇතත්, ඇතැම් රජයේ ආයතනවල මෙම ක්‍රමවේදය මෙතෙක් ක්‍රියාත්මක නොවන බව වාර්තා වී ඇත.

03. ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2017 අයවැය යෝජනාවන්හි අංක 373 යටතේ ද සියලුම රාජ්‍ය ආයතනවල කාර්යය මණ්ඩලය පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළයුතු බවට යෝජනා කර ඇත.

04. එබැවින් මෙම ක්‍රමවේදය මෙතෙක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්ව ඇති සියලුම රජයේ ආයතනවල මෙහි පළමුවන ඡේදයේ සඳහන් චක්‍රලේඛ විධිවිධාන අනුව ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගැනීමට පියවර ගත යුතුය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය